# ආත්මවාදී ලබ්ධිය

උඩු සිතෙහි තර්කය පදනම් වන්නේ, එනම් උඩු සිත තර්ක කරන්නේ, ද්විකෝටික න්‍යාය ඇසුරෙන් වුව ද, යටි සිත තර්ක කරන්නේ කිනම් න්‍යායක් ඇසුරෙන් දැයි අපි නො දනිමු. ඇතැම් විට යටි සිත තර්ක නොකරනවා ද විය හැකි ය. තර්කය අපට අවශ්‍යවන්නේ එක් ප්‍රස්තුතයක සිට තවත් ප්‍රස්තුතයකට යෑමේ දී ය. යුක්ලීඩීය ත්‍රිකෝණයක කෝණ තුනෙහි ඓක්‍යය සෘජු කෝණ දෙකකට සමාන යැයි නිගමනයකිරීමේ දී අපි ද්විකෝටික න්‍යාය මත පදනම් ව තර්ක කරමු. එහි දී ත්‍රිකෝණයෙහි එක් ශීර්ෂයක් ඔස්සේ සම්මුඛ පාදයට සමාන්තරව සරල රේඛාවක් නිර්මාණයකර ඉන්පසු අනුරූප කෝණ හා ඒකාන්තර කෝණ පිළිබඳ ප්‍රතිඵල යොදාගෙන අදාළ නිගමනයට පැමිණිය හැකි ය.

යටි සිතට සරල රේඛා යනුවෙන් සංකල්පයක් අවශ්‍ය නොවනවා විය හැකි ය. සරල රේඛා නොමැති නම් ත්‍රිකෝණ හා බහුඅශ්‍ර ද නැත. එහෙත් යටි සිතෙහි යම් සංකේත ඇති බවත් ඒ අපට සෘජුව ම නො තේරෙන බවත් පැහැදිළි ය. සෘජුව තේරෙන්නේ ය යන්නෙන් කියැවෙන්නේ උඩු සිතට යමක් ගෝචරවන ආකාරය ය. උඩු සිත යමක් තේරුම්ගත් පසු ඒ ඇතැම් විට යටි සිතෙහි තැන්පත්වනවා විය යුතු ය. අප මතකය යනුවෙන් සඳහන්කරන්නේ එසේ යටි සිතෙහි තැන්පත් වූ දත්තවලට විය හැකි ය. එහෙත් මෙයින් කියැවෙන්නේ යටි සිත දිගින් දිගට ම පවතින්නේ ය යන්න නො වෙයි. යටි සිත හා උඩු සිත කොටස් වශයෙන් ඇති චිත්තය ඇති වී නැති වී යයි. එසේ නැති වීමේ දී එක් චිත්තයක් අනුගාමී චිත්තයට යම් තොරතුරු ලබා දෙයි. මතකය යනුවෙන් අදහස්කෙරෙන්නේ එසේ ගලායන තොරතුරු ය.

මතකය හා මම යන සංකල්ප ඇතිවන්නේ එසේ තොරතුරු ගලා යෑම හේතුවෙන් ය. සිංහල බෞද්ධ සංස්කෘතියක ප්‍රවාද, එනම් අපේ ප්‍රවාද, නිර්මාණයකරන අපට මම යන සංකල්පය මව්කුසෙහි ම ඇතිවන්නක් වෙයි. එයට හේතුව පටිසන්ධි චිත්තය ඇතිවීමේ දී චුති චිත්තය විසින් පටිසන්ධි චිත්තයට යම් තොරතුරු ලබා දීම ය. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි මම යන්න අනෙකකු මත පදනම් නොවන්නේ එබැවින් ය. සසර ගමනෙහි සත්ත්වයාට මම යන සංකල්පය ලැබී ඇත.

එහෙත් අප කලින් ද පෙන්වා දී ඇති පරිදි බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි සත්ත්වයකුට මම යන සංකල්පය මව්කුසෙහි දී තිබිය නො හැකි ය. එයට හේතුව මේ භවයට පෙර භවයක් ක්‍රිස්තියානි ආගමෙහි හෝ ක්‍රිස්තියානි සංස්කෘතියෙහි නො තිබීම ය. කිනම් අර්ථයකින් වුව ද ක්‍රිස්තියානි ආගමෙහි හා ක්‍රිස්තියානි සංස්කෘතියෙහි නැවත ඉපදීමක් (ස්වර්ගයෙහි හෝ අපායෙහි හෝ) තිබිය හැක්කේ මේ භවයෙන් පසුව ය. එය ද මිනිසුන්ට මිස අනෙක් සත්ත්වයන්ට නො වෙයි. මෙය මෙසේ නොවේ යැයි යමකු කියන්නේ නම් ඔහු හෝ ඇය සමග කොළඹ මහජන පුස්තකාලය වැනි තැනක දී ප්‍රසිද්ධ විවාදයකට මා සූදානම් ය.

ක්‍රිස්තියානි සංස්කෘතියෙහි මේ භවයට පෙර වෙනත් භවයක් මිනිසුන්ට නොමැති හෙයින් සිංහල බෞද්ධ සංස්කෘතියෙහි මෙන් නොව එහි මිනිසුන්ට මම යන සංකල්පය ඇතිවන්නේ කෙසේ ද යන ප්‍රශ්නයට පිළිතුරු දීමට සිදුවන්නේ මේ භවයෙහි ම අත්දැකීම් යොදාගනිමින් ය. ක්‍රිස්තියානි සංස්කෘතියෙහි මිනිසුන්ට අභ්‍යන්තරයෙන් ම මම යන සංකල්පය ඇති නොවන බැවින් එහි මම යන සංකල්පය මේ භවයෙහි ඇතිවන ආකාරය සඳහා ප්‍රවාදයක් නිර්මාණය කළ යුතුවෙයි. එහි දී කසිකබල් පශ්චාත්නූතනවාදීන් කරන්නේ අනෙකකු ඔස්සේ මම යන සංකල්පය නිර්මාණය කිරීම ය. මේ කසිකබල් පශ්චාත්නූතනවාදීන්ට අනුව ළදරුවනට මම යන සංකල්පය නොමැතිවා පමණක් නොව ළදරුවනට සිතන්නට ද බැරි ය. අනෙකකු මැදිහත් වී ළදරුවාට මම යන සංකල්පය ඇති කෙරෙන අන්දම තේරුම්කිරීමට ලකාන් වැනි කසිකබල් මනෝ විශ්ලේෂකයන් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි අසාර්ථක උත්සාහයක් ගෙන ඇත.

අනෙක් සත්ත්වයන්ට මම යන සංකල්පය ඇතිවීම පිළිබඳ ප්‍රශ්නය තවමත් බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි පැන නොනගියි. අනෙක් සතුන්ට ද ළදරුවන්ට මෙන් ම සිතීමට නොහැකි යැයි බටහිර විද්‍යාඥයෝ තවමත් සිතති. එහෙත් දැන් දැන් බටහිර ජීව විද්‍යාවෙහි ම ඇතැම් නිරීක්ෂණවලට අනුව ඇතැම් අනෙක් සත්ත්වයන්ට ද විඥානයක් ඇත.

© Prof. Nalin De Silva

මේ නිරීක්ෂණ වර්ධනය වීමේ දී බටහිර ජීව විද්‍යාඥයන්ට ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවනු ඇත. මිනිසා පමණක් දෙවියන් වහන්සේගේ ප්‍රතිබිම්බය වනසේ නිර්මාණය කෙරී ඇතැයි කියන ක්‍රිස්තියානි සංස්කෘතියෙහි මිනිසුන් නොවන සතුන්ට විඥානයක් හා මම යන සංකල්පයක් ඇතිවන්නේ කෙසේ දැයි තේරුම් කිරීමට ප්‍රවාද නිර්මාණයකිරීම අභියෝගයක් වනු ඇත.

කෙසේ වෙතත් කසිකබල් විද්‍යාඥයන්ට කසිකබල් යැයි කීමට මම මැළි නො වෙමි. බටහිර විද්‍යාඥයන් සියළු දෙනාම අයින්ස්ටයින් ගණයේ යැයි නො සිතිය යුතු ය. බටහිර ඇතැම් සමාජීය විද්‍යාඥයන්ට ප්‍රවාදය (Theory) යනු කුමක් දැයි වැටහීමක් නැත. ඔවුන් සිතන්නේ ප්‍රවාදයක් යනු නොවරදින දෙයක් බව ය. මෙහි දී ඔවුන්ගේ සිත්වල තියරි යන්නෙහි නිරුක්තිය ද බලපානවා නිසැක ය. තියරි, තීසීස් ආදී පද දෙවියන් වහන්සේ හා සම්බන්ධ තියෝ යන වචනය සමග බැඳී ඇත. ඉංගිරිසියෙන් තියොලොජි යනු දේවධර්ම විද්‍යාවය. ඒ බයොලොජි ජීව විද්‍යාව වන්නාක් මෙන් ය. විද්‍යාඥයන්ට තම සංස්කෘතියෙන් ගැලවීම පහසු නො වෙයි.

මනෝ විශ්ලේෂණය වැනි විෂයක ඊනියා ප්‍රවාද නිරීක්ෂණ සමග සංගත වේදැයි සොයා බැලීමක් නැත. ෆ්‍රොයිඩ්ගේ මනෝ විකාර හෝ ලකාන් ගේ මනස්කෘෂ්ටිය (ෆැන්ටසි - fantacy)  පිටුපස ඇත්තේ වාස්තවික යථාර්ථයයි. මනස්කෘෂ්ටිය යථාර්ථය විය නො හැකි ය. මොවුන්ගේ ඊනියා ප්‍රවාදවලින්  තේරුම්ගත හැක්කක් නැත. මනස්කෘෂ්ටිය කුමක්දැයි දැනගැනීම සඳහා ඇති නිර්ණායක කවරේ ද? මනස්කෘෂ්ටිය දැනගත හැක්කේ යථාර්ථය දන්නේ නම් ය. ෆැන්ටසි ගැන කතාකරන්නවුන් පළමුව යථාර්ථය හෝ ඊනියා යථය දැනගන්නේ කෙසේ දැයි කියා දිය යුතු ය. අනෙක් අතට වත්මන් ඩාවිනීය පරිණාමවාදය ද ලකාන්ලාගේ ප්‍රවාද වැනි වෙයි. අද නව්‍ය ඩාවිනීයවාදය ද ෆ්‍රොයිඩ්වාදය මෙන් ම සියල්ල ලිංගිකත්වයට ඌනනයකිරීමට සැරසෙයි. මේ ප්‍රවාදවලට කසිකබල් ප්‍රවාද කීමටත් ඒ නිර්මාණයකරන්නන්ට කසිකබල් විද්‍යාඥයන් යැයි කීමටත් මම පසුබට නො වෙමි.

අනෙක් අතට කසිකබලාට කසිකබලායැයි නොකියා සිටීමට තරම් ව්‍යාජ සුචරිතවාදයක් මට නැත. මෙරට ප්‍රභූ යැයි සම්මත පාසල් කොළඹ නුවර ආදී නගරවල ඉංගිරිසින් විසින් පිහිටුවනු ලැබුයේ බටහිර ව්‍යාජ සුචරිතවාදය මෙරට ළමුන්ට ද හුරුකිරීම සඳහා ය. මේ ව්‍යාජ සුචරිතයෙහි අපේ දැනුම, අපේ ප්‍රවාද ආදිය, මිථ්‍යා බවට පත්කෙරෙයි. ඒ කරන්නේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි බිහි වූ දැනුම එකම විද්‍යාත්මක දැනුම බවට පත්කරමින් ය. බොරු යථාර්ථයක් (දැන් බොරු යථයක්) ගැන කතාකරමින් දේශපාලන බලය යොදා තම දැනුම පමණක් එකම විද්‍යාත්මක දැනුම බවට මතවාද සකස්කරමින් සිංහල බෞද්ධ සංස්කෘතියෙහි හා වෙනත් සංස්කෘතීන්හි බිහි වූ දැනුම් මිථ්‍යා බව ප්‍රකාශකරමින් ගෙන යන සටකපට වැඩ පිළිවෙළ හමුවේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ව්‍යාජ සුචරිතවාදයට ඉඩ දී කසිකබලාට කසිකබලා යැයි නොකියා සිටීමට මට නො හැකි ය. කසිකබළුන් මෙන් ම ප්‍රභූ යැයි සම්මත පාසල්වලින් බිහිකෙරෙන ඇතැම් ව්‍යාජ සුචරිතවාදීන් ද හෙළිදරවු කළ යුතු ය. ව්‍යාජ සුචරිතවාදීන්ට කළ හැක්කේ මගේ සුචරිතය ගැන ප්‍රශ්නකිරීම පමණ ය. එහෙත් ව්‍යාජ සුචරිතවාදීන්ගේ සුචරිතය ගැන මට වැටහීමක් ඇති බැවින් බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියට සාපේක්ෂව මා සුචරිතවාදියකු නොවීම පිළිබඳ මට අබමල් රේණුවක ප්‍රමාණයටවත් කම්පාවක් නැත.

බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි නිර්මාණය වන මම යන සංකල්පය හා සම්බන්ධ ප්‍රවාදයෙහි ඇති අනෙකා ගලා එන්නේ දෙවියන් වහන්සේ පිළිබඳ ඇති විශ්වාසයෙන් ය. බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි බාහිර බලවේග, බාහිර කාරක ආදිය පිටුපස ඇත්තේ අපෙන් තොරව ඇති ලෝකයක් අපෙන් බැහැර ව නිර්මාණය කළ දෙවියන් වහන්සේ ය. මේ කරුණු මා සඳහන්කරන්නේ කිසිම ආගමකට ගැරහීමට නො වෙයි. සිංහල බෞද්ධයෝ අනෙක් ආගම්වලට අගෞරව නො කරති. එහෙත් ඒ නිසා ක්‍රිස්තියානි සංස්කෘතියෙහි නිර්මාණය කෙරී ඇති දැනුම් යටත්විජිතවාදයට එකඟ වීමට හෝ හිස නැමීමට හෝ අපට නො හැකි ය. ක්‍රිස්තියානි සංස්කෘතියෙහි නිර්මාණය වී ඇති දැනුමෙන් අප පෙළෙයි. අද බටහිරයන් ලෝකය පාලනයකරන්නේ ප්‍රධාන වශයෙන් ම ඔවුන්ගේ දැනුම ආධාරයෙනි. අප අපේ ප්‍රවාද නිර්මාණයකරන්නේ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙන් නිදහස්වීම සඳහා ය. එයට අකමැති අය විවිධ ස්ථරවල සිටින බව මම දනිමි.

© Prof. Nalin De Silva

උඩු සිතෙන් යටි සිතට තොරතුරු යම් ක්‍රමයකට සන්නිවේදනය වී ඒ එහි තැන්පත් වෙයි. කලින් සඳහන් කර ඇති පරිදි සමහර විට උඩු සිත යටි සිත යනුවෙන් බෙදීමක් ද අවශ්‍ය නොවනවා විය හැකි ය. ඒ කෙසේ වෙතත් යටි සිතෙන් උඩු සිතට තොරතුරු ගෙනයෑමේ, සන්නිවේදනය කිරීමේ හැකියාවක් ද වෙයි. මේ තොරතුරු සන්නිවේදනය වන්නේ කෙසේ දැයි තේරුම්කිරීමට අපට ආකෘතියක් නැත.

ෆ්‍රොයිඩ්, ලකාන් වැනි බටහිර මනෝ විශ්ලේෂකයන්ට අනුව යටි සිත යනුවෙන් දෙයක් පවතියි. එය ඔවුන් විසින් විවිධ නම්වලින් හැඳින්වෙනවා විය හැකි ය. ඇතැම් විට ඔවුන් සිත කොටස් දෙකකට නොව තුනකට බෙදනවා විය හැකි ය. ඒ කුමක් වුවත්, කුමන නමකින් හැඳින්වුවත් යටි සිත යැයි ගතහැකි යමක් ඔවුන්ට වෙයි. ඒ යටි සිත පවතින දෙයක් ද වෙයි. මේ අන්කිසිවක් නොව ආත්මය සමග බැඳී ඇත්තක් වෙයි. බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි විද්‍යාඥයන්ගෙන් අති විශාල බහුතරයට ආත්මවාදී අදහස්වලින් බැහැරවීමට නො හැකි ය.

ලකාන් හෝ වෙනත් බටහිර මනෝ විශ්ලේෂකයකු හෝ ලබ්ඩිය (libido) ගැන කතාකිරීමේ දී ඔවුන් කරන්නේ ආත්මවාදී සංකල්පයක් නිර්මාණයකර ඒ යොදාගැනීම ය. උඩු සිතට කලින් යම් යම් දේ දැනගැනීමේ හෝ සිතීමේ හෝ දැනීමේ හෝ හැකියාවක් ලබ්ඩියට වෙයි. ලබ්ඩියේ ක්‍රියාකාරීත්වය උඩු සිතට පළමුවෙන් නො දැනෙයි. එහෙත් යම් ආකාරයකින් ලබ්ඩියෙන් උඩු සිතට යම් යම් තොරතුරු සන්නිවේදනය වෙයි. මෙහි දී ප්‍රශ්නය වනුයේ ලබ්ඩිය නිරපේක්ෂ වශයෙන් පැවතීම ය. බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි විද්‍යාඥයන්ට නිරපේක්ෂ වාස්තවික යමක් අවසාන විග්‍රහයෙහි දී අවශ්‍ය වෙයි. ඒ අවශ්‍යතාව ආත්මවාදී සංකල්පයක් වූ ඊනියා ලබ්ඩිය මගින් ඉටුකර දෙනු ලැබෙයි. අපේ සංස්කෘතියෙහි නිර්මාණය කෙරෙන සංකල්ප සියල්ල සාපේක්ෂ වෙයි. එහි ආත්මවාදී සංකල්පවලට කිසිදු ඉඩක් නො ලැබෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva